# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 63 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 18 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 නොවැම්බර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිළ : රු. 3.00 යි.                    තැපැල් ගාස්තුව : රු. 3.10 යි.

## 1992 අංක 63 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 15/92

### 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1992 අංක 63 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 28 දරන පනතේ 8 වන වගන්තිය **සංශෝධනය** කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ, (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ ඡේදයේ LX) වන අනුඡේදයේ "ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය; සහ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ ඡේදයේ (LXI) වන අනුඡේදයේ "පිහිටුවන ලද රබර් පර්යේෂණ මණ්ඩලය. තව ද" යන වචන වෙනුවට "පිහිටුවන ලද රබර් පර්යේෂණ මණ්ඩලය ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; තව ද

(3) ඒ ඡේදයේ (LXI) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක් වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

"(LXII) 1990 අංක 35 දරන බුද්ධ ශාසන පනතින් පිහිටුවන ලද බුද්ධ ශාසන අරමුදල.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය **සංශෝධනය** කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ක) ඡේදයේ "ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය; සහ" යන වචන වෙනුවට "ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ග) ඡේදයේ "ව්‍යුත්පන්න වූ ආදායම් නියෝජනය කරනු ලබන කොටස" යන වචන වෙනුවට "ව්‍යුත්පන්න වූ ආදායම නියෝජනය කරනු ලබන කොටස ; සහ" යන වචන ආදේශ කිරීමෙන් , තව ද

(3) ඒ උපවගන්තියේ (ග) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ච) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ ඇති කරන ලද යම් සමාගමක යම් සේවානියුක්තියකින් යම් සේවානියුක්තයකු විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ඔහුට ගෙවන ලද 4 (1) වන වගන්තියේ (ඇ) ඡේදයේ (1) වන අනුඡේදයෙහි සඳහන් අවස්ථා වෝචිත පරිදි, යම් රාජ්‍ය සංස්ථාවක හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතනයක සේවා කාලයකට ආරෝපණය කරනු ලබන යම් මුදලක කොටස.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (ආ) ඡේදයේ "16අ වන, 16ආ වන, 17 වන, 17අ වන" ඉලක්කම් සහ වචන වෙනුවට "16අ වන, 16ආ වන, 16ඇ වන, 17 වන, 17අ වන" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (අ) ඡේදයේ (XXI) වන අනුඡේදයේ "නිල ලැයිස්තුගත සමාගමක යම් කොටසක් යම් තැනැත්තකු විසින් අත්කර ගැනීමේ දින සිට එක් අවුරුද්දකට පසුව ඒ කොට සෙහි" යන වචන වෙනුවට "නිල ලැයිස්තුගත පොදු සමාගමක යම් කොටසක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ක) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(කක) ස්වර්ණාභරණ අපනයනය කිරීමෙන යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායම ;";

(2) ඒ වගන්තියේ (ප) ඡේදයෙහි "යම් නිල ලැයිස්තුගත" යන වචන සිට "ලාභ සහ ආදායම" දක්වා වූ වචන සහ ඉලක්කම් වෙනුවට "යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක යම් කොටසක් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙර විකිණීමෙන් යම් තැනැත්තකුට ව්‍යුත්පන්න වූ හෝ උපචිත වන 3 වන උපවගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල යම් ලාභ සහ ආදායම ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (ප) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(බ) අවස්ථාවෝචිත පරිදි ලලිත කලා, සාහිත්‍ය හෝ ක්‍රීඩා විෂයය භාර අමාත්‍යවරයාගෙන් කලින් ලබා ගත් ලිඛිත අනුමතය ඇතිව කරන ලද ප්‍රදානයක් වන්නා වූ, ලලිත කලා සාහිත්‍යය හෝ ක්‍රීඩා ක්ෂේත්‍ර

යෙහි තම විශිෂ්ටත්වය පිළිගැනීමෙහි ලා ප්‍රදාන යක් හෝ ප්‍රදාන වශයෙන් යම් පුද්ගලයකු විසින්, 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී භාර ගන්නා ලද රුපියල් එක් ලක්ෂයක් නොඉක්ම වන්නා වූ යම් මුදලක හෝ මුදල්වල එකතු වන කොටස;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 15අ. වගන්තිය වශයෙන් බලසහිත විය යුතු ය :—

"යම් වාසික ආගන්තුකයකුගේ ශ්‍රී ලංකාවෙහි ජීවත දී, උද්ගත වන්නාවූ හෝ ව්‍යුත්පන්න වූ ලාභ සහ ආදායම නිදහස් කිරීම.

15අ. යම් වාසික ආගන්තුකයකුගේ ශ්‍රී ලංකාවේ දී ලැබෙන හෝ ව්‍යුත්පන්න වූ ලාභ සහ ආදායම නොවන්නා වූ ලාභ සහ ආදායම, ආණ්ඩුව විසින් අනුමත කරනු ලැබුවා වූ යම් වාසික ආගන්තුක ක්‍රමයක් යටතේ ඒ වාසික ආගන්තුකයා ලියාපදිංචි කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට වර්ෂ පහක කාලසීමාවක් සඳහා ඔහු ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය :

එසේ වුව ද ඒ වර්ෂ පහක කාලසීමාව අවසන් වීමට පෙරාතුව එම වාසික ආගන්තුකයාට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කොට ඇති අවස්ථාවක ඒ වාසික ආගන්තුකයාට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කරනු ලැබූ දිනයෙන් ආරම්භ වන කාලසීමාව සඳහා ඔහුගේ එම ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 16ඇ. සහ 16ඈ. වගන්ති ඇතුළත් කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 16ආ වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති පිළිවෙලින් ඒ ප්‍රඥප්තියේ 16ඇ. වගන්තිය සහ 16ඈ. වගන්තිය වශයෙන් බලසහිත විය යුතු ය :—

"සංචාරක හෝටල්වලට අදාළ ඇතැම් ව්‍යාපාරවල ලාභ සහ ආදායම් වැඩිදුර කාල සීමාවන් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

16ඇ. (1) සංචාරකයන් සඳහා යම් හෝටලයක් මෙහෙයවන්නා වූ සහ—

(i) (1981 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ව්‍යාපාරය කර ගෙන යාමට ආරම්භ කරනු ලැබුවා වූ යම් ව්‍යවසායක් හැර) 16 වන වගන්තියේ (අ) ඡේදයේ ; හෝ

(ii) 16අ වගන්තියේ

සඳහන් වන්නා වූ යම් ව්‍යවසායක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන යම් ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභ සහ ආදායම වර්ෂ පහක කාල සීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වර්ෂ පහක කාලසීමාව—

(අ) ඒ ව්‍යවසාය (1) වන උපවගන්තියේ (1) වන ඡේදයේ සඳහන් ව්‍යවසායක් වන අවස්ථාවක, 1992 අප්‍රේල් මස 1 වන දින සිට ගණන් ගනු ලැබිය යුතුය :

එසේ වුව ද 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යවසායේ ලාභවලින් සහ ආදායමෙන් 29 වන වගන්තිය යටතේ අඩු කර ගත හැකි ඒ ව්‍යවසායට ආරෝපණය කරනු ලබන යම් පාඩුවක ප්‍රමාණය ඒ ලාභ සහ ආදායම ඉක්මවන්නා වූ හෝ ඊට සමාන වන්නා වූ අවස්ථාවක, වර්ෂ පහක කාලසීමාව 1993 අප්‍රේල් මස 1 වන දින සිට ගණන් ගනු ලැබිය යුතු ය :

එසේම තවදුරටත් 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යවසායේ ලාභවලින් සහ ආදායමෙන් 29 වන වගන්තිය යටතේ අඩු කරනු ලැබිය හැකි යම් පාඩුවක ප්‍රමාණය ඒ ලාභ සහ ආදායම ඉක්මවන්නා වූ හෝ ඊට සමාන වන්නා වූ අවස්ථාවක වර්ෂ පහක කාලසීමාව 1994 අප්‍රේල් මස 1 වන දින සිට ගණන් ගනු ලැබිය යුතු ය ;

(ආ) ඒ ව්‍යවසාය 16අ වගන්තියෙහි සඳහන් ව්‍යවසායක් වන අවස්ථාවක, වර්ෂ පහක කාලසීමාව ඒ වගන්තියෙහි සඳහන් වර්ෂ දහයක කාලසීමාව අවසන් වන තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට ගණන් ගනු ලැබිය යුතු ය.

අතිරේක නිදන කාමර ඉදි කරන සංචාරකයන් සඳහා වූ යම් හෝටලයක ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

16ඇ. (1) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් නිශ්චිත ව්‍යවසායක අදාළ ලාභ සහ ආදායම (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (iii) වන අනුඡේදයේ සඳහන් නිදන කාමරවලින් දහයකට නොඅඩු සංඛ්‍යාවක් ඉදිකොට ඇති බවට ලංකා සංචාරක මණ්ඩලය විසින් සහතික කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද, ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට වර්ෂ පහක කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා—

(අ) "නිශ්චිත ව්‍යවසාය" යන්නෙන් සංචාරක යන් සඳහා යම් හෝටල් මෙහෙයවන්නා වූ සහ—

(i) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 6(1)(v) වන වගන්තිය යටතේ හෝ මේ පනතේ 16 වන වගන්තියේ (අ) ඡේදය යටතේ හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්තා වූ;

(ii) 1981 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ව්‍යාපාරය කරගෙන යාමට ආරම්භ කරනු ලැබුවා වූ;

(iii) නිදන කාමර දහයකට නොඅඩු සංඛ්‍යාවක් ඉදිකිරීම ලංකා සංචාරක මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇත්තා වූ ද 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ඉදිකිරීම ආරම්භ කරනු ලැබුවේ යයි ද 1994 අප්‍රේල් මස 01 වන දිනට පෙර ඉදිකරනු ලැබුවේ යයි ද ලංකා සංචාරක මණ්ඩලය විසින් සහතික කරනු ලැබ ඇත්තා වූ;

(iv) 1992 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වූ වර්ෂය තුළ ඒ ව්‍යවසාය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ සේවා නියුක්තයන්ගේ සාමාන්‍ය සංඛ්‍යාවට වඩා සේවා නියුක්තයන් විසිපස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් (1) වන උපවගන්තියෙහි සඳහන් වර්ෂ පහ ආරම්භයේ දී සේවයෙහි නියුක්ත කරන්නා වූ සහ ඒ කාලසීමාව අවසන් වන තෙක් ඒ ලෙස නොකඩවා සේවයෙහි නියුක්ත කරන්නා වූ

යම් ව්‍යවසායක් අදහස් වේ.

මේ අනුඡේදයේ කාර්ය සඳහා—

සේවානියුක්තයන් සම්බන්ධයෙන් වන විට "සාමාන්‍ය සංඛ්‍යාව" යන්නෙන්, ඒ වර්ෂය මුළුල්ලේ එක් එක් දිනයෙහි ඒ ව්‍යවසායෙහි සේවයෙහි නියුක්ත කරනු ලැබූ සේවා නියුක්තයන්ගේ මුළු එකතුව තුන්සිය හැට පහෙන් බෙදීමෙන් ලැබුණ සංඛ්‍යාව අදහස් වේ;

ව්‍යවසායක් සම්බන්ධයෙන් වන විට "සේවානියුක්තයා" යන්නෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ යම් අර්ථසාධක අරමුදලකට ඒ ව්‍යවසාය විසින් අඛණ්ඩව දායක මුදල් ගෙවනු ලබන්නේ ඒ ව්‍යවසායේ යම් සේවානියුක්තයකු වෙනුවෙන් ද එවැනි යම් සේවානියුක්තයකු අදහස්වේ;

(ආ) යම් නිශ්චිත ව්‍යවසායක් සම්බන්ධයෙන් වන විට සහ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට "අදාළ ලාභ සහ ආදායම" යන්නෙන්, (අ) ඡේදයේ (III) වන අනුඡේදයේ සඳහන් නිදන කාමර සංඛ්‍යාවට ඒ ව්‍යවසායේ මුළු නිදන කාමර සංඛ්‍යාව දරන අනුපාතයම වන අනුපාතයක්, යම් මුදල් ප්‍රමාණයක්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යවසායේ (ප්‍රාග්ධන වත්කම් බැහැර කිරීමෙන් ලබන ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභවලට සහ ආදායමට දරන්නේ ද, එම මුදල් ප්‍රමාණය අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඇ වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "ඒ සමාගම විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට අවුරුදු පහක කාලයකට" යන වචන වෙනුවට "ඒ සමාගම විසින් යම් වර්ෂයක ස්වකීය ගනුදෙනු සම්බන්ධයෙන් ලාභ අත්කර ගැනීමට ආරම්භ කරනු ලැබුවේ ද ඒ වර්ෂයේ සිට ගණන් බලනු ලැබූ වර්ෂ පහක කාලයකට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි—

(අ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ "සැලසීම සඳහා වූ ව්‍යවසායක්; හෝ" යන වචන වෙනුවට "සැලසීම සඳහා වූ ව්‍යවසායක්;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයේ "පුරෝගාමී ස්වභාවයෙන් වූ ව්‍යවසායක්" යන වචන වෙනුවට "පුරෝගාමී ස්වභාවයෙන් වූ ව්‍යවසායක්; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(iv) මුහුදෙහි බේරාගැනීමේ සහ ඇදීමේ, සෝදිසි කිරීමේ සහ ගලවා ගැනීමේ ඇතුළුව අක්වෙරළ සමුද්‍රීය සේවාවන් සැලසීම සඳහා පුරෝගාමී ස්වභාවයකින් වූ ව්‍යවසායක්.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඇ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "ගිවිසුමකට එළඹ ඇත්තා වූ යම් ව්‍යවසායකට" යන වචන වෙනුවට "ගිවිසුමකට එළඹ ඇත්තා වූ බඩු හෝ යම් වෙළඳ ද්‍රව්‍ය අපනයනය කිරීමෙහි 'ලා නිරත යම් ව්‍යවසායකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 ඇ වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇඇ වගන්තියේ (2) වන උප වගන්තියේ "බඩු නිෂ්පාදනය කිරීමෙහි හෝ අපනයනය කිරීමෙහි නිරත වන" යන වචන වෙනුවට "බඩු නිෂ්පාදනය කිරීමෙහි, බඩු අපනයනය කිරීමෙහි හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් සේවයක් සැලසීමෙහි නිරත වන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇඇ වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (උඋ) ඡේදයේ "1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයේ "යම්—

(1) 1963 අංක 11 දරන "යන වචන සහ ඉලක්කම් සිට "1991 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසු ගෙවිය යුතු වූ ද බද්දක් :" තෙක් වූ සියලු වචන සහ ඉලක්කම් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙනු ඡේද ආදේශ කරන්න :—

"(ඔ) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් ලාභ සහ ආදායම් නිශ්චය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව සම්බන්ධයෙන් ඒ තැනැත්තා ගෙවීමට යටත්—

(i) 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවිය යුතු යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් ; හෝ

(ii) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 47 වන වගන්තිය හෝ 48 වන වගන්තිය හෝ 48අ වගන්තිය යටතේ ඉඩ දෙනු ලබන යම් අඩු කිරීමක් අඩු කිරීමෙන් පසුව ඒ පනත යටතේ ගෙවිය යුතු පිරිවැටුම් බද්දක් ; හෝ

(iii) පිළිවෙළින් (i) වන අනුඡේදයෙහි හෝ (ii) වන අනුඡේදයෙහි සඳහන් කරනු ලැබ ඇති ව්‍යාපාර පිරිවැටුම් බද්දට අනුරූප වන්නාවූ ද යම් පළාත් සභාවක් විසින් පනවනු ලැබූ යම් ප්‍රඥප්තියක් යටතේ 1991 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ගෙවිය යුතු වූ ද බද්දක් :".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ "16අ වගන්තිය හෝ 17අ වගන්තිය" යන ඉලක්කම් සහ වචන වෙනුවට "16අ වගන්තිය හෝ, 16ඇ වගන්තිය හෝ 17අ වගන්තිය" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(3අ) 16 වන වගන්තියේ (අ) ඡේදයේ සඳහන් කොට ඇත්තා වූ ද 16ඇ වගන්තියේ විධිවිධාන අදාළ වන්නා වූ ද යම් ව්‍යවසායක් විසින් 16ඇ (1) වන වගන්තියේ සඳහන් වර්ෂ පහක කාලසීමාව ආරම්භ කිරීමට පෙරතුව යම් පාඩුවක් විඳ ඇති අවස්ථාවක, ඒ වර්ෂ පහක කාලසීමාව ආරම්භවීමට පෙරතුව වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ ව්‍යවසාය කරගෙන යන තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් ඒ පාඩුව හෝ ඒ පාඩුවේ යම් පංගුවක් අඩුකරනු ලැබ නොමැති නම් ඒ වර්ෂ පහක තක්සේරු කාලසීමාවේ යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ ව්‍යවසායේ ලාභවලින් සහ ආදායමෙන් සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය හැකි ප්‍රමාණයට ඒ පාඩුව හෝ ඒ පංගුව අඩු කළ යුතු ය :

එසේ වුව ද,—

(i) ඒ අඩුකිරීම 16ඇ (1) වන වගන්තියෙහි සඳහන් තක්සේරු වර්ෂ පහේ පළමුවන තක්සේරු වර්ෂය සඳහා ඒ ලාභවලින් සහ ආදායමෙන් සහ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් පළමුවෙන් කරනු ලැබිය යුතු ය;

(ii) යම් තක්සේරු වර්ෂයක් සඳහා අඩු කිරීම පළමුවෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යවසායේ ලාභවලින් සහ ආදායමෙන් කරනු ලැබිය යුතු අතර, ඉන්පසුව ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය යුතුය ;

(iii) යම් තක්සේරු වර්ෂයක් සඳහා අඩු කිරීම ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යවසායේ ලාභවල සහ ආදායමේ සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම එකතුව ඉක්මවන්නා වූ අවස්ථාවක එම අතිරික්තය ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යවසායේ ලාභවලින් සහ ආදායමෙන් සහ ඉන් ඉක්බිතිවම එළඹෙන වර්ෂය සඳහා යනාදී වශයෙන් ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය යුතුය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(i) ඒ උපවගන්තියේ (අඅඅ) ඡේදයේ " 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව වන එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ උපවගන්තියේ (අඅඅ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (අඅඅඅ) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් හතළිස් දෙදහසක දීමනාවක් ; " සහ

(iii) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ " (අඅ) ඡේදයෙහි හෝ (අඅඅ) ඡේදයෙහි හෝ සඳහන් " යන වචන වෙනුවට " (අඅ) ඡේදයෙහි හෝ (අඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅ) ඡේදයෙහි සඳහන් " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ—

(i) ඒ උපවගන්තියේ පළමුවන අතුරු වගන්තියේ (ඉ) ඡේදයේ "1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ උපවගන්තියේ පළමුවන අතුරු වගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් ;

"(ඊ) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් හතළිස් දෙදහසක දීමනාවක් ;";

(iii) ඒ උපවගන්තියේ දෙවන අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් :—

"එසේ වුව ද, සේවානියුක්තයන් විසින් පමණක් දායක මුදල් ගෙවනු ලබන්නා වූ යම් සකසුරුවම් ඉතිරි කිරීමේ හෝ ගොඩනැගිලි සමිතියක හෝ සුභසාධක අරමුදලක යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ යුතු ආදායම—

(i) ඒ තක්සේරු වර්ෂය 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, රුපියල් විසිහත්දහසකට ; සහ

(ii) ඒ තක්සේරු වර්ෂය 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, රුපියල් හතළිස් දෙදහසකට

සමාන දීමනාවක් එයින් අඩු කිරීමෙන් පසුව, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමිතියේ හෝ අරමුදලේ තක්සේරු කළ යුතු ආදායම විය යුතු ය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) ඒ උපවගන්තියේ (ඈ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:—

"(ඈ) (ට) ඡේදයේ සඳහන් අනුමත ව්‍යවසායක් නොවන, අනුමත ව්‍යවසායක පවත්නා, කොටස් හැර සාමාන්‍ය කොටස් මිලදී ගැනීමෙහිලා යම් තැනැත්තකු විසින් ආයෝජනය කරන ලද යම් මුදලක් :

එසේ වුව ද ඒ ව්‍යවසාය මේ වගන්තියේ (9) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් සමාගමක් වන අවස්ථාවක, 1997 මාර්තු මස 31 වන දිනට පසුව එසේ ආයෝජනය කරන ලද යම් මුදලක්, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන්ව ඇත ද, එය සුදුසුකම් ලබන ගෙවීමක් නොවන බවට සලකනු ලැබිය යුතු ය ;";

(ආ) ඒ උපවගන්තියේ (ඉඉ) ඡේදයේ—

(i) ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ "නිවාසයක් තැනීම සඳහා බිම් කොටසක් මිලට ගැනීම සඳහා 1989 අප්‍රේල් මස 9 වන දින හෝ ඉන් පසුව ප්‍රදානය කරනු ලැබූ ණයක මුල් මුදල" යන ඉලක්කම් සහ වචන වෙනුවට "නිවාසයක් තැනීම සඳහා 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව ප්‍රදානය කරනු ලැබූ යම් ණය මුදලක මුල් මුදල" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ "නිවාසය සම්බන්ධයෙන් 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඇතුළත් වූ," යන ඉලක්කම් සහ වචන වෙනුවට "නිවාසය සම්බන්ධයෙන් 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ඇතුළත් වූ," යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ඊඊ) ඡේදයේ "ඉදිකරනු ලැබූ පළමු නිවාසය වන්නා වූ ද පිරිවැය රුපියල් දස ලක්ෂය නොඉක්මවන්නා වූ ද 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව" යන ඉලක්කම් සහ වචන වෙනුවට "ඉදිකරනු ලැබූ පළමු නිවාසය වන්නා වූ ද පිරිවැය රුපියල් දසලක්ෂය නොඉක්මවන්නා වූ ද 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්

පසුව, එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ඉදිකරනු ලබන්නා වූ ද නිවාසයක් " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (උඋ) ඡේදයේ " පළමු නිවාසය හෝ නිවාසයක් තැනීම සඳහා වන පළමු බිම් කොටස වන්නා වූ ද 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන " යන වචන සහ ඉලක්කම් වෙනුවට " පළමු නිවාසය හෝ නිවාසයක් තැනීම සඳහා වන පළමු බිම් කොටස වන්නා වූ ද 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඉ) ඒ උපවගන්තියේ (ඌඌ) ඡේදයේ " පුද්ගලයකු විසින් ගෙවන ලද යම් වාරිකයක් " යන වචන වෙනුවට " 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර පුද්ගලයකු විසින් ගෙවනු ලබන යම් වාරිකයක් " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ඊ) ඒ උපවගන්තියේ (ඌඌඌ) ඡේදයේ " 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(උ) ඒ උපවගන්තියේ (ඒ) ඡේදයේ " පුද්ගලයකු විසින් වියදම් කරන ලද මුදලක් ; " යන වචන වෙනුවට " පුද්ගලයකු විසින් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වියදම් කරන ලද මුදලක් " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ඌ) ඒ අනුඡේදයේ (ඔඔ) ඡේදයේ " 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව " යන වචන සිට " ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් මුදලක් " ; යන සියලු ඉලක්කම් සහ වචන ඉවත් කොට ඒ වෙනුවට " 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව රුපියල් දසලක්ෂයක් නොඉක්මවන්නා වූ මුදලකට යම් නිවාසයක් හෝ මහල් නිවාසයක් ඉදිකිරීමෙහිලා හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරියේ අනුමතය ඇතිව ඉදිකරන ලද්දා වූ ද ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ අර්ථානුකූලව ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය දේපළ සංයුක්ත වන්නා වූ ද වාසස්ථාන ඉඩකඩ පිළිබඳ යම් ඒකකයක් 1989 අප්‍රේල් මස 1 වන දින හෝ

ඉන් පසුව එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව මිලට ගැනීමෙහි ලා ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් මුදලක් ;" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(එ) ඒ උපවගන්තියේ (ග) ඡේදයේ "පුනස්ථාපනයට පත් කිරීම මත යම් තැනැත්තකු විසින් වියදම් කරනු ලැබුවේ යයි" යන වචන වෙනුවට "පුනස්ථාපනයට පත්කිරීම මත 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව යම් තැනැත්තකු විසින් වියදම් කරනු ලැබුවේ යයි" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඒ) ඒ උපවගන්තියේ (ච) ඡේදයේ "1983 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1983 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ඔ) ඒ උපවගන්තියේ (ජ) ඡේදයේ "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී වෛද්‍ය වියදම් වශයෙන්" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකදී වෛද්‍ය වියදම් වශයෙන්" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (5ඇ) උපවගන්තියේ (iii) ඡේදයේ "යම් සුදුසුකම් ලබන ගෙවීමක් සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(8) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "යම් තක්සේරු වර්ෂයකදී" යන වචන සිට "ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු ය." තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(i) යම් තක්සේරු වර්ෂයකදී යම් තැනැත්තකු විසින් කරනු ලැබූ හෝ කරනු ලැබුවේ යයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (අ), (ඇ), (ක) හෝ (ග) ඡේදයේ සඳහන් ; හෝ

(ii) 1992 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක දී යම් තැනැත්තකු විසින් කරනු ලැබූ හෝ කරනු ලැබුවේ යයි සලකනු ලබන

(2) වන උපවගන්තියේ (උ) ඡේදයේ සඳහන් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කළ නොහැකි යම් සුදුසුකම් ලබන ගෙවීමක මුදල ඊළඟට එළඹෙන ඒ තක්සේරු වර්ෂයේ දී සහ ඒ ආදී වශයෙන් ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය යුතුය ;"; තව ද,

(4) ඒ වගන්තියේ (9) වන උපවගන්තියේ (ආ) ඡේදයේ—

(අ) ඒ ඡේදයේ (1) වන අනුඡේදයේ "සහ ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්තා වූ; නැත හොත්" යන වචන වෙනුවට "සහ 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්තා වූ; නැත හොත්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව මහ කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබ ඇත්තා වූ ඒ අනුමතයේ ප්‍රතිඵලය වශයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහ කොළඹ ආර්ථික කොමිෂන් සභාව සමග 1992 සැප්තැම්බර් මස 1 වන දිනට පෙරාතුව ගිවිසුමකට එළඹ ඇත්තා වූ ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (vi) වන අනුඡේදයේ "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (vi) වන අනු ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනු ඡේදය එකතු කිරීමෙන් :—

"(vii) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමු වන උපලේඛනයේ IIඉ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණය අනුව ;" සහ

(ඇ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ—

(i) ඒ අතුරු වගන්තියේ (iii) වන අනුඡේදයේ "1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් විසි ගතර දහසක් සහ" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් විසිහතර දහසක් ;" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ අතුරු වගන්තියේ (iv) වන අනුඡේදයේ "1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් සහ ; තව ද

(iii) ඒ අතුරු වගන්තියේ (iv) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

"(v) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හතළිස් දෙදහසක් ;" ;

(2) ඒ උපවගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "යම් සේවා නියුක්තියකින් ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ඔහුට ගෙවනු ලැබූ යම් මුදලක්, හෝ" යන වචන වෙනුවට "යම් සේවානියුක්තියකින් ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී හෝ යම් තදනන්තර අවස්ථාවක දී ඔහුට ගෙවනු ලැබූ යම් මුදලක්, හෝ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ "ඉහත සඳහන් මුදල් ප්‍රමාණය හෝ මුදල් ප්‍රමාණයන්" වෙනුවට "ඉහත සඳහන් එක් එක් මුදල් ප්‍රමාණය හෝ මුදල් ප්‍රමාණයන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3ආආ) උපවගන්තිය ඉවත් කිරීමෙන් ;" ;

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(4අ) 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී යම් පුණ්‍යායතනයක් විසින් ගිලන් හෝ දුගී අය වෙනුවෙන් ආයතනගත සත්කාර සලසන්නා වූ ද, ඒ සත්කාරය සැලසීම සම්බන්ධයෙන් වියදම ඒ පුණ්‍ය ආයතනය විසින් දරනු ලබන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නාවූද අවස්ථාවක, විෂය කාරණය සම්බන්ධයෙන් සියලු අවස්ථාවල දී අඩු කිරීම හෝ ලිහිල් කිරීම සාධාරණ සහ යුක්ති සහගත බව කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා එම ආයතනයේ ලාභ සහ ආදායම සම්බන්ධයෙන් ඒ පුණ්‍යායතනය විසින් ගෙවිය යුතු බද්ද, ඔහු විසින් නියම කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව, අඩු කිරීම හෝ ලිහිල් කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකි ය.";
තව ද,

(5) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉඉ වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉඉ වගන්තියේ "සේවානියුක්තියෙන් ලබන ලාභ ඇතුළත් වන අවස්ථාවක" යන වචන සිට "ආදායම් බද්දෙන් අඩු කරනු ලැබිය යුතු ය." යන වචන තෙක් වූ සියලු වචන ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"සේවානියුක්තියෙන් ලබන ලාභ ඇතුළත් වන අවස්ථාවක—

(අ) (i) ඒ තක්සේරු වර්ෂය 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයක් නම් රුපියල් එක්දහස් පන්සියයකට, සහ

(ii) ඒ තක්සේරු වර්ෂය 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් නම් රුපියල් එක්දහස් අට සියයකට, හෝ

(ආ) ඒ තක්සේරු වර්ෂය සඳහා සේවා නියුක්තියෙන් ඒ පුද්ගලයාගේ ලාභවලට ආරෝපණය කරනු ලබන ආදායම් බදු මුදලට

සමාන මුදල් ප්‍රමාණයක් යන මේ දෙකින් කවර වූ හෝ අඩු මුදල් ප්‍රමාණය ඒ පුද්ගලයා විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු වන ආදායම් බද්දෙන් අඩු කරනු ලැබිය යුතු ය.".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ ඡේදයේ (v) වන අනුඡේදයේ "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් .

(2) ඒ ඡේදයේ (v) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(vi) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ යුතු ආදායම රුපියල් තුන්ලක්ෂ තුන් දහස් තිහක් නොඉක්මවන්නා වූ,".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "ඔහුට හිමිකම් තිබිය යුතු ය." යන වචන වෙනුවට "ඔහුට හිමිකම තිබිය යුතුය : ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

එසේ වුව ද ඒ තැනැත්තා වාසික තැනැත්තකු නොවන අවස්ථාවක ඒ ප්‍රකාශයේ දක්වා ඇති අත්තිකාරම් සමාගම් බද්ද ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කිරීමට ඔහුට හිමිකම නොතිබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ (ආ) ඡේදයේ "1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1අ) උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (iv) වන ඡේදයේ "1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් සහ ; තවද

(2) ඒ උපවගන්තියේ (iv) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(v) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හතළිස් දෙදහසක්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ වන වගන්තිය සංශෝධනය කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා ඔහු හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් (2) වන උපවගන්තියේ සඳහන් ඔහුගේ හෝ ඒ හවුල් ව්‍යාපාරයේ ආදායම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙහි ආදායම් බදු සහ අනුරූප කාලසීමාව සඳහා වෙනත් යම් රටක දී ආදායම් බදු ගෙවන ලද බවට හෝ ගෙවීමට යටත් බවට කොමසාරිස් ජනරාල් වරයා සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලබන අවස්ථාවක, එවිට (මේ වගන්තිය යටතේ යම් සහනයක් ප්‍රදානය කරනු ලැබීමට පෙර) එම වෙනත් යම් රටේදී ඔහුගේ හෝ ඒ හවුල් ව්‍යාපාරයේ එම ආදායම සම්බන්ධයෙන් ඔහු හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ආදායම් බද්ද ඉක්මවා ශ්‍රී ලංකාවේ දී ඔහු හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් එම ආදායම් සම්බන්ධයෙන් ගෙවිය යුතු ආදායම් බද්දක් වේනොත්, එම අතිරික්තයට සමාන මුදලකින් ශ්‍රී ලංකාවේ දී ඒ තැනැත්තා හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් සහන ලැබීමට ඔහුට හෝ ඒ හවුල් ව්‍යාපාරයට හිමිකම් ඇත්තේ ය."

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්.—

"(2) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) (i) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලංකාවේ දී කළමනාකරණ උපදේශක සේවාවන් සලසනු ලබන්නා වූ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වන යම් නිර්වාසික තැනැත්තකුට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි යම් හවුල් ව්‍යාපාරයකට ; හෝ

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් ගිවිසුමකට එළඹියා වූ සමාගමක් වන්නා වූ සහ—

(අ) මිලට ගනු ලැබූ හෝ ඉදිකරනු ලැබූ යම් ගොඩනැගිල්ලක සහ මිලට ගනු ලැබූ යම් ඉඩමක, පිරියතක, යන්ත්‍රයක හෝ ගෘහ භාණ්ඩ වල ; සහ

(ආ) ව්‍යවසායේ ප්‍රයෝජනය සඳහා (අ) ඡේදයෙහි ඇතුළත් කරනු නොලැබූ යම් වත්කමක් අත් කර ගැනීමේ පිරිවැය

පියවීමට ඇමරිකා එක්සත් ජනපදයේ ඩොලර් දසලක්ෂ පනහක් හෝ වෙනත් යම් විදේශීය ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලක් ඒ ගිවිසුමේ නිශ්චිත කාල සීමාව ඇතුළත ඒ ගිවිසුම අනුව ශ්‍රී ලංකාවෙහි ආයෝජනය කරනු ලැබුවා වූ හෝ එලෙස ආයෝජනය කිරීමට එකඟ වූ යම් වාසික සමාගමකට, වාස්තු විද්‍යාත්මක ඉංජිනේරු, පරිමාණ සමීක්ෂණය හෝ ඉදිකිරීම් කළමනාකරණ සේවාවන් සහ ඊට අනුයාත වන වෙනත් යම් සේවාවන් ශ්‍රී ලංකාවෙහි දී සලසන්නා වූ යම් නිර්වාසික තැනැත්තකුට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි වූ යම් හවුල් ව්‍යාපාරයකට ;

(ආ) (i) (අ) ඡේදයේ (1) වන අනුඡේදයේ සඳහන් සේවාවන්, ඒ අනුඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් හෝ යම් හවුල් ව්‍යාපාරයක් විසින් 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව සැලසීමෙන් ; හෝ

(ii) (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් යම් සේවාවන් ඒ ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් හෝ යම් හවුල් ව්‍යාපාරයක් විසින් 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව සැලසීමෙන්

ශ්‍රී ලංකාවෙන් උද්ගත වන හෝ ව්‍යුත්පන්න වූ ලාභ සහ ආදායම සම්බන්ධයෙන්

අදාළ විය යුතු ය. ".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තියේ (2අ) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (2අඅ) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ සඳහන් දින හෝ ඉන් පෙර ආදායම හෝ ධනය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්

නැවූ සහ එයින් (2අ) උපවගන්තියේ විධිවිධාන යටතේ ආදායම හෝ ධනය පිළිබඳ වාර්තාවක් සපයනු නොලැබූ ලෙස සලකනු ලබන්නා වූ අවස්ථාවක ඔහු විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිත ආකෘතිය අනුව නොවන බවට හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිත යම් විස්තර ඇතුළත් නොවන බවට එම තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂයේ අවසානයේ සිට දින තිහක් ඇතුළත තක්සේරුකරුවකු විසින් ඒ තැනැත්තාට ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 92අ වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන්—

"එසේ වුව ද—

(අ) ඒ වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව යම් සමාගමක් විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ අවස්ථාවක, මේ වගන්තිය යටතේ දැන්වීමක් සමාගම වෙත දෙනු නොලැබුව ද ඒ සමාගම විසින් 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා නැතහොත් ව්‍යවස්ථාපිත ආදායම ආගණනය කරනු ලබන්නේ වෙනත් යම් කාල සීමාවක් සඳහා ද ඒ කාලසීමාව සඳහා ගැසට් පත්‍රයේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ප්‍රකාශ සහ යම් උපලේඛන ඉදිරිපත් කළ යුතු ය ; තව ද

(ආ) යම් හවුල් ව්‍යාපාරයක් විසින් හෝ සමාගමක් නොවන යම් තැනැත්තකු විසින් ඒ වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ සහ 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, හෝ එම තක්සේරු වර්ෂය සඳහා ව්‍යවස්ථාපිත ආදායම ආගණනය කරනු ලබන්නේ වෙනත් යම් කාල සීමාවක් සඳහා ද ඒ කාලසීමාව සඳහා, ඒ වෙළඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ පිරිවැටුම රුපියල් පනස් ලක්ෂයක් ඉක්ම වූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ තක්සේරු වර්ෂය සඳහා හෝ ඒ කාලසීමාව සඳහා ඉදිරිපත් කිරීමට ඒ හවුල්කරුට හෝ ඒ තැනැත්තාට මේ වගන්තිය යටතේ දැන්වීමක් දෙනු නොලැබුව ද කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ප්‍රකාශ සහ උපලේඛන ඉදිරිපත් කළ යුතු ය."

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ —

(අ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ—

"1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වැඩිදුර අතුරු වගන්තිය එකතු කිරීමෙන් :—

"එසේම තවදුරටත් 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා හෝ ඒ තක්සේරු වර්ෂය සඳහා ව්‍යවස්ථාපිත ආදායම ආගණනය කරනු ලබන්නේ වෙනත් යම් කාලසීමාවක් සඳහා ද, ඒ කාලසීමාව සඳහා වූ ආදායම් වාර්තාවක් සනාථ කිරීමෙහි ලා—

(i) යම් සමාගමක් විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් ඒ සමාගම විසින් සපයනු ලැබූ; හෝ

(ii) යම් හවුල් ව්‍යාපාරයක් විසින් හෝ සමාගමක් නොවන යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නාවූ යම් වෙළඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක පිරිවැටුම රුපියල් පනස් ලක්ෂය ඉක්මවන්නා වූ අවස්ථාවක ඒ වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා හෝ ඒ කාලසීමාව සඳහා එම හවුල් ව්‍යාපාරය හෝ තැනැත්තා විසින් සපයනු ලැබූ ,

ගිණුම් ප්‍රකාශයක් අනුමත ගණකාධිකාරිවරයකු විසින් ක්‍රියාත්මක කරන ලද විගණනයක පදනම මත පිළිගෙන කරනු ලැබිය යුතු ය.".

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— (ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.)

"වාර්තා සැපයීම පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනයක් නියම කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට ඇති බලය.

96. (1) (i) තමාගේ ආදායම, ධනය හෝ ත්‍යාග පිළිබඳව ද තමාට දරුවකු සිටිනම් ඒ දරුවාගේ ආදායම හෝ ධනය පිළිබඳවද දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත වාර්තාවක් සපයන ලෙස නියම කරමින් තක්සේරුකරුවකු විසින්

92 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ දෙනු ලැබූ ලිඛිත දැන්වීමක් අනුව කටයුතු කිරීමට යම් තැනැත්තකු පැහැර හරින අවස්ථාවක, හෝ

(ii) 92 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සැපයීමට නියමිත වාර්තාවක් ඒ වගන්තියේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත සැපයීමට යම් තැනැත්තකු පැහැර හරින අවස්ථාවක, හෝ

(iii) 103 වන වගන්තියේ යම් නියමයන් අනුව කටයුතු කිරීමට යම් සේවා යෝජකයකු පැහැර හරින අවස්ථාවක,

කොමසාරිස් ජනරාල්වරයා විසින්—

(අ) ඒ තැනැත්තා හෝ ඒ සේවායෝජක විෂයෙහි රුපියල් පනස් දහසක් නොඉක්මවන දණ්ඩනයක් නියම කළ හැකි අතර, ඒ දණ්ඩනය නියම කිරීම සම්බන්ධයෙන් ඒ තැනැත්තාට හෝ සේවායෝජකට ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය හැකි ය;

(ආ) ඒ තැනැත්තා හෝ ඒ සේවායෝජකයා වෙත කරනු ලබන ලිඛිත දැන්වීමක් මගින්—

(i) එම දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළදී ඒ දණ්ඩනය ගෙවීමට, සහ

(ii) ඒ වාර්තාව සපයා නොමැති අවස්ථාවක හෝ ඒ නියමය අනුව කටයුතු කර නොමැති අවස්ථාවක එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලසීමාව තුළදී ඒ වාර්තාව සැපයීමට හෝ ඒ නියමය අනුව කටයුතු කිරීමට

නියම කළ හැකි ය.

(2) අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා හෝ ඒ සේවායෝජක විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ වාර්තාව සැපයීමට හෝ නියමය අනුව කටයුතු කිරීමට ඔහුගේ පැහැර හැරීම තම පාලනයෙන් බාහිර අවස්ථාගත කරුණු නිසා බවට සහ අවස්ථාවෝචිත පරිදි, ඔහු විසින් ඒ වාර්තාව සපයා ඇති බවට හෝ ඒ නියමය අනුව කටයුතු කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයෙන් ඔප්පු කරනු ලැබුවහොත්, මේ වගන්තිය යටතේ ඒ තැනැත්තා හෝ ඒ සේවා යෝජක විෂයෙහි නියම කරන ලද දණ්ඩනය කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩු කරනු ලැබිය හැකි ය. නැතහොත් අත්හරිනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු හෝ යම් සේවා යෝජකයකු විෂයෙහි දණ්ඩනයක් නියම කරනු ලැබ ඇති අවස්ථාවක, 151 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය හෝ (ඈ) ඡේදය යටතේ හෝ දැන්වීමට හෝ නියමයට අදාළව 151 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (iii) වන ඡේදය යටතේ නඩු පැවරීමට ඒ තැනැත්තා හෝ ඒ සේවායෝජක යටත් නොවිය යුතු ය.".

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

**"පැහැර හැරීම සඳහා දණ්ඩනය.** 110. මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් සේවා යෝජකයකු විසින් ගෙවිය යුතු යම් කාල සීමාවක් සඳහා වූ යම් ආදායම් බද්දක් පැහැර හැර ඇති අවස්ථාවක, ඒ සේවායෝජක විසින්—

(අ) ඒ ගෙවීම් කාලසීමාව 1992 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් කාලසීමාවක් වන අවස්ථාවක, ඒ බද්දට අතිරේකව—

(i) ඒ බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක් ; සහ

(ii) ඒ බද්ද පැහැර හරිනු ලැබීමට පත් වීමෙන් පසුව මාස හයක් ඉකුත් වීමට පෙර ඒ බද්ද ගෙවනු නොලබන අවස්ථාවක, ඒ බද්දෙන් සියයට පහළොවකට සමාන මුදලක, වැඩිදුර දණ්ඩන මුදලක් ගෙවිය යුතුය. තව ද

(ආ) ඒ ගෙවීම් කාලසීමාව 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් ගෙවීම් කාලසීමාවක් වන අවස්ථාවක ඒ බද්ද දට අතිරේකව—

(i) ඒ බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක් ; සහ

(ii) ඒ බද්ද පැහැර හරිනු ලැබීමට පත් වීමෙන් පසුව, දින තිහක් ඉකුත් වීමට පෙර, ඒ බද්ද ගෙවනු නො ලබන අවස්ථාවක එය පැහැර හැර පවතින කාලය තුළ දින තිහක එක් එක් මැඩිදුර කාලසීමාවක් හෝ ඉන් කොටසක් වෙනුවෙන් පැහැර හරිනු ලැබ ඇති බද්දෙන් සියයට දෙකකට සමාන මුදලක වැඩිදුර දණ්ඩන මුදලක් ගෙවිය යුතු ය :

එසේ වුව ද—

(අ) ගෙවීම පැහැර හැරීම තම පාලනයෙන් බාහිර අවස්ථාගත කරුණු නිසා බවට, සහ පැහැර හැර ඇති බදු මුදල තමා විසින් ගෙවා ඇති බවට සහ ඒ ගෙවීම කරන ලද අවස්ථාවේදී සැපයීමට නියමිත ප්‍රකාශය සපයන ලද බවට, ඒ සේවා යෝජක විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයෙන් ඔප්පු කරනු ලැබුවහොත්, ඒ සේවා යෝජක විසින් ගෙවිය යුතු එවැනි යම් දණ්ඩනයක මුදල කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්හරිනු ලැබිය හැකි ය. නැතහොත් අඩු කරනු ලැබිය හැකි ය ;

(ආ) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩනය වශයෙන් ගෙවිය යුතු මුළු මුදල 1992 අප්‍රේල් මස 1 දින හෝ ඉන් පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා පැහැර හරිනු ලැබූ බද්ද වෙනුවෙන්, පැහැර හරිනු ලැබූ බද්දෙන් සියයට පනහක් නොඉක්මවිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තිය සංශෝධනය කිරීම.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ "තමාගේම නාමයෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගේ නාමයෙන් ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය වෙත" යන වචන සිට "සියයට විස්සක් වූ අනුප්‍රමාණයක් ආදායම් බදු අඩු කරනු ලැබිය යුතුය."

තෙක් වූ සියලු වචන සහ ඉලක්කම් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් :—

"තමාගේම නාමයෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගේ නාමයෙන් ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය වෙත තැන්පත් කර ඇති යම් මුදල් ප්‍රමාණයක් මත යම් තක්සේරු වර්ෂයක දී ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ඒ තක්සේරු වර්ෂය—

(i) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, එසේ ගෙවිය යුතු පොලියෙන් සියයට විස්සක අනුප්‍රමාණයක් ; සහ

(ii) ඒ තක්සේරු වර්ෂය 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක එසේ ගෙවිය යුතු පොලියෙන් සියයට පහළොවක අනුප්‍රමාණයක්

ආදායම් බදු අඩු කරනු ලැබිය යුතුය." ;

(2) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ "සියයට 20 ක්" යන වචන සහ ඉලක්කම් ඒ අතුරු වගන්තියේ යෙදෙන කවර හෝ විටෙක ඒ වෙනුවට "සියයට 15 ක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඌ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඌ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

113ඌ. මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ගෙවිය යුතු ආදායම් බදු කිසිවක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින්—

(අ) ඒ තක්සේරු වර්ෂය 1992 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, ඒ බද්දට අතිරේකව—

(i) ඒ බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක් සහ ;

(ii) එම බද්ද පැහැර හරිනු ලැබීමට පත් වීමෙන් පසුව මාස හයක් ඉකුත් වීමට හෝ ඒ බද්ද ගෙවනු නොලබන අවස්ථාවක, බද්දෙන් සියයට පහළොවකට සමාන මුදලක වැඩිදුර දණ්ඩන මුදලක්

ගෙවිය යුතුය ; තව ද

(ආ) ඒ තක්සේරු වර්ෂය 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක ඒ බද්දට අතිරේකව—

(i) ඒ බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක් ; සහ

(ii) ඒ බද්ද පැහැර හරිනු ලැබීමට පත් වීමෙන් පසුව දින තිහක් ඉකුත් වීමට හෝ ඒ බද්ද ගෙවනු නොලබන අවස්ථාවක, එය පැහැර හැර පවතින කාලය තුළ දින තිහක එක් එක් වැඩිදුර කාලසීමාවක් හෝ ඉන් කොටසක් වෙනුවෙන් පැහැර හරිනු ලැබ ඇති බද්දෙන් සියයට දෙකකට සමාන මුදලක් වැඩිදුර දණ්ඩන මුදලක්

ගෙවිය යුතු ය :

එසේ වුවද—

(අ) ගෙවීම පැහැර හැරීම ස්වකීය පාලනයෙන් බාහිර අවස්ථාගත කරුණු නිසා බවට සහ පැහැර හැර ඇති බදු මුදල එය විසින් ගෙවා ඇති බව සහ ඒ ගෙවීම කරන ලද අවස්ථාවේ දී සැපයීමට නියමිත ප්‍රකාශය සපයන ලද බවට ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයෙන් ඔප්පු කරනු ලැබුවහොත් ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ගෙවිය යුතු එවැනි යම් දණ්ඩනයක මුදල කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්හරිනු ලැබිය හැකි ය. නැතහොත් අඩු කරනු ලැබිය හැකි ය ; තවද

(ආ) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩනය වශයෙන් ගෙවිය යුතු මුළු මුදල, 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා පැහැර හරිනු ලැබූ බද්ද වෙනුවෙන් පැහැර හරිනු ලැබූ බද්දෙන් සියයට පනහක් නොඉක්ම විය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 113 ඒ වගන්තිය සංශෝධනය කිරීම.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඒ වගන්තියේ " තැන්පතු මගින් මුදල් භාරගැනීමේ හා ඒ මත පොලිය ගෙවීමේ තම ව්‍යාපාරය " යන වචන වෙනුවට " තැන්පතු හෝ ණය පත්‍ර හෝ බැඳුම්කර ආකාරයෙන් හෝ වෙනත් යම් ආකාරයෙන් වූ ණය මගින් සහ ඒ මත පොලිය ගෙවීමේ ව්‍යාපාරය " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ XVඅ පරිච්ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ XVආ පරිච්ඡේදය වශයෙන් බලසහිත විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ XV ආ අලුත් පරිච්ඡේදයක් ඇතුළත් කිරීම.

" *XV* ආ පරිච්ඡේදය

**නිශ්චිත තැනැත්තන් විසින් ගෙවන ලද නිශ්චිත ගාස්තුවලින් ආදායම් බදු අඩුකර ගැනීම.**

නිශ්චිත තැනැත්තන් විසින් නිශ්චිත ගාස්තුවලින් ආදායම් බදු අඩු කරගත යුතු බව.

113ඹ. (1) සෑම නිශ්චිත තැනැත්තකු විසින්ම මේ පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව, 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී යම් තැනැත්තකුට හෝ යම් හවුල් ව්‍යාපාරිකයකුට ගෙවිය යුතු යම් නිශ්චිත ගාස්තුවකින්, ඒ නිශ්චිත ගාස්තුව ගෙවනු ලැබූ වේලාවේ දී, ඒ නිශ්චිත ගාස්තුවෙන් සියයට තුනක අනුප්‍රමාණයක් අනුව ආදායම් බද්දක් අඩු කරනු ලැබිය යුතු ය.

(2) මේ උපවගන්තියේ කාර්ය සඳහා—

(අ) යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට "නිශ්චිත තැනැත්තා" යන්නෙන් තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන්—

(i) වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් හවුල් ව්‍යාපාරයකට එකතුව රුපියල් තිස් දහසකට නොඅඩු නිශ්චිත ගාස්තුවක් ;

(ii) එකතුව රුපියල් දෙලක්ෂ පනස් දහසකට නොඅඩු නිශ්චිත ගාස්තු

ඒ තක්සේරු වර්ෂයේ දී හෝ ඒ තක්සේරු වර්ෂයට ඉහතින්ම වූ තක්සේරු වර්ෂයේ දී ගෙවීමට හෝ බැර කිරීමට ඉඩ ඇත්තාවූ යම් තැනැත්තෙක්, හවුල් ව්‍යාපාරයක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

(ආ) "නිශ්චිත ගාස්තුව" යන්නෙන් අවස්ථෝචිත පරිදි, යම් තැනැත්තකු විසින් හෝ යම් හවුල් ව්‍යාපාරයක යම් හවුල් කරුවකු විසින්, හෝ කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නාවූ ස්වාධීන ස්වභාවයකින් වූ යම් වෘත්තියක් හෝ රක්ෂාවක් හෝ

වෙනත් කටයුතු අතරතුර අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා විසින් හෝ හවුල් ව්‍යාපාරය විසින් ඉටු කරන ලද සේවාවන් සඳහා ප්‍රතිඡ්ඨාව වශයෙන් යම් නිශ්චිත තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් මුදලක් අදහස් වන අතර, ඒ නිශ්චිත තැනැත්තා විසින් ගෙවිය යුතු යම් කොමිස් මුදලක්, තැරැව් ගාස්තුවක් හෝ ඒ සමාන ස්වභාවයකින් වූ වෙනත් මුදලක් ඊට ඇතුළත් වන මුත් ඒ නිශ්චිත තැනැත්තා යටතේ වූ සේවා නියුක්තිය අතරතුර, ඒ නිශ්චිත තැනැත්තා විසින් ඒ නිශ්චිත තැනැත්තාගේ යම් සේවා නියුක්තියකුට ගෙවිය යුතු යම් මුදලක් ඊට ඇතුළත් නොවේ.

**මේ පරිච්ඡේදය යටතේ නිශ්චිත ගාස්තුවලින් ආදායම් බදු අඩුකිරීම සම්බන්ධයෙන් XVඅ පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු බව.**

113ඕ. බැංකු සහ මූල්‍ය ආයතන විසින් ගෙවන ලද පොලියෙන් ආදායම් බදු අඩු කිරීමට, එසේ අඩුකරගන්නා ලද ආදායම් බදු වෙනුවෙන් බැර, විධාන නිකුත් කිරීම් බැංකුවල සහ මූල්‍ය ආයතනවල කාර්ය ආදායම් බදු අඩුකිරීමේ දී පැහැර හැරීම, බැංකු සහ මූල්‍ය ආයතන මත තක්සේරු නිකුත් කිරීම අභියාචනා සහ පැහැර හැරීම සඳහා දණ්ඩන යන විෂයයන්ට අදාළ XVඅ පරිච්ඡේදයේ විධිවිධාන නිශ්චිත තැනැත්තන් විසින් නිශ්චිත ගාස්තුවලින් ආදායම් බදු අඩු කිරීමට, එසේ අඩුකරන ලද ආදායම් බදු වෙනුවෙන් බැර, විධාන නිකුත් කිරීම නිශ්චිත තැනැත්තන්ගේ කාර්ය. ආදායම් බදු අඩු කිරීමේ දී පැහැර හැරීම, නිශ්චිත තැනැත්තන් මත තක්සේරු නිකුත් කිරීම, අභියාචනා මේ පරිච්ඡේදය යටතේ පැහැර හැරීම් සඳහා දණ්ඩනය යන විෂයයන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව XVඅ පරිච්ඡේදයේ “බැංකු සහ මූල්‍ය ආයතන” යන වචන සහ “පොලිය” යන වචන වෙනුවට “නිශ්චිත ගාස්තුව” යන වචන ඒ පරිච්ඡේදයේ යෙදෙන කවර හෝ විටෙක එලෙස ආදේශ කරනු ලැබූ ලෙස අදාළ විය යුතුය. එසේ වූවද යම් නිශ්චිත තැනැත්තකු විසින් යම් හවුල් ව්‍යාපාරයකට ගෙවන ලද යම් නිශ්චිත ගාස්තුවකින් මේ පරිච්ඡේදය යටතේ අඩුකර ගනු ලැබූ ආදායම් බදු සඳහා බැර, ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් අන්‍යෝන්‍ය එකඟත්ව යෙන් තීරණය කරනු ලැබුවහොත් මිස, ඒ හවුල්

ව්‍යාපාරයේ ලාභ සහ පාඩු ඒ හවුල්කරු විසින් බෙදා ගන්නා අනුපාතය අනුව ඒ හවුල්කරුවන් අතර බෙදා හැරිය යුතු බවට ලිහිල් කිරීමට යටත් විය යුතු ය.".

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු වගන්තියේ "රුපියල් පනහක ගාස්තුවක් ද" යන වචන වෙනුවට "රුපියල් එක් දහස් පන් සියයක ගාස්තුවක් ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින්" යන වචන සිට "දණ්ඩන මුදලක් ලෙස ගෙවිය යුතුය ;" යන වචන තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

**ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් බද්දක් පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, පැහැර හරින්නා විසින්—

(අ) ඒ තක්සේරු වර්ෂය 1992 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක පැහැර හරිනු ලැබූ බද්දට අතිරේකව—

(i) පැහැර හරිනු ලැබූ මුදලින් සියයට පහකට සමාන මුදලක දණ්ඩන මුදලක් ; සහ

(ii) යම් මුදලක් පැහැර හරිනු ලැබීමට පත්වීමෙන් පසුව දින තිහක් ඉකුත් වීමට පෙර පැහැර හරිනු ලැබූ එම මුදල ගෙවනු නොලබන අවස්ථාවක, එය පැහැර හැර ඇති කාලය තුළ මාස තුනක එක් එක් වැඩිපුර කාල සීමාවක් හෝ ඒ කාලසීමාවෙන් කොටසක් සම්බන්ධයෙන් පැහැර හරිනු ලැබූ මුදලින් සියයට පහකට සමාන වැඩිපුර මුදලක්

ගෙවිය යුතුය ; තව ද

(ආ) ඒ තක්සේරු වර්ෂය 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක පැහැර හරිනු ලැබූ බද්දට අතිරේකව—

(i) ඒ බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක් ; සහ

(ii) ඒ බද්ද පැහැර හරිනු ලැබීමට පත්ව දින තිහක් ඉකුත්වීමට පෙර ඒ බද්ද ගෙවනු නොලබන අවස්ථාවක, පැහැර හරිනු ලැබ පවත්නා කාලය තුළ දින තිහක එක් එක් වැඩිපුර කාල සීමාවක් හෝ ඉන් කොටසක් සම්බන්ධයෙන් පැහැර හරිනු ලැබූ බද්දෙන් සියයට දෙකකට සමාන මුදලක වැඩිපුර දණ්ඩන මුදලක්

ගෙවිය යුතු ය:".

ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තිය සංශෝධනය කිරීම.

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (iii) වන ඡේදයේ "101 වන වගන්තියේ (2) වන උපවගන්තියේ හෝ 102 වන වගන්තියෙහි (අ), (ආ) හෝ (ඇ) ඡේදවල" යන ඉලක්කම් සහ වචන වෙනුවට "96 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 101 වන වගන්තියේ (2) වන උපවගන්තියේ හෝ 102 වන වගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 157 වන වගන්තිය සංශෝධනය කිරීම.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 157 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "දේශීය ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන් සහ දේශීය ආදායම් තක්සේරුකරුවන් යම් සංඛ්‍යාවක් ද" යන වචන වෙනුවට "දේශීය ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන්, දේශීය ආදායම් තක්සේරුකරුවන් සහ දේශීය ආදායම් බදු නිලධරයන් යම් සංඛ්‍යාවක්ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තිය සංශෝධනය කිරීම.

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තියේ (12) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(13) ශ්‍රී ලංකා ආණ්ඩුව සහ වෙනත් යම් දේශයක ආණ්ඩුව අතර ඇති කර ගන්නා ලද සහ මේ පනතේ 82 වන වගන්තියෙහි සඳහන් යම් ගිවිසුමක් අනුව කටයුතු කිරීමේ දී තොරතුරු හුවමාරු කර ගැනීම මගින් තමාගේ දැන ගැනීමට ලැබෙන යම් තැනැත්තකුගේ කටයුතුවලට අදාළ යම් විස්තර ගිවිසුමේ විෂය කාරණය වන බදු තක්සේරු කිරීමට හෝ එකතු කිරීමට හෝ බලාත්මක කිරීමට හෝ ඊට අදාළ යම් වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමට සම්බන්ධ වූ යම් තැනැත්තෙක් හෝ අධිකාරයක් නොවන යම් තැනැත්තකුට හෝ අධිකාරයකට හෙළි කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට නියම කෙරෙන්නේ යයි මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපලේඛනයේ IIඇ කොටසෙහි "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය:—" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය:—" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ II ඇ කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

"IIඉ කොටස

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

බදු අයකළ හැකි ආදායමෙහි පළමුවන රු. 21,000 සම්බන්ධයෙන් ... සියයට 10

බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 24,000 සම්බන්ධයෙන් ... සියයට 20

බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 24,000 සම්බන්ධයෙන් ... සියයට 30

ඉතිරි බදු අයකළ හැකි ආදායම සම්බන්ධයෙන් ... සියයට 35.".

37. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.*

(1) ඒ උපලේඛනයේ I වන කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"I වන කොටස

II වන කොටසෙහි හෝ III වන කොටසෙහි, හෝ IV වන කොටසෙහි හෝ IVඅ කොටසෙහි හෝ Vවන කොටසෙහි හෝ Vඅ කොටසෙහි හෝ Vආ කොටසෙහි හෝ VI වන කොටසෙහි හෝ VIII වන කොටසෙහි හෝ IX වන කොටසෙහි හෝ X වන කොටසෙහි සඳහන් සමාගමක් නොවන ශ්‍රී ලංකාවේ වාසික සමාගමක්..

1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ සමාගමේ බදු අයකළ හැකි ආදායම මත ... සියයට 45"

(2) ඒ උපලේඛනයේ IVඅ කොටසෙහි "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපලේඛනයේ IVඅ කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

"IVආ කොටස

කුඩා සමාගම්

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනු ප්‍රමාණ

(1) සමාගමේ බදු අයකළ හැකි ආදායම රුපියල් දෙලක්ෂ පනස් දහස නොඉක්මවන්නේ නම් ... සියයට 33 1/3

(2) සමාගමේ බදු අයකළ හැකි ආදායම රුපියල් දෙලක්ෂ පනස් දහසක් ඉක්මවන්නේ නම් එහෙත් රුපියල් තුන් ලක්ෂ තුන්දහස් තිහක් නොඉක්මවන්නේ නම්—

(i) රුපියල් දෙලක්ෂ පනස් දහසින් සියයට 33 1/3 කට සමාන මුදලක්, සහ

(ii) ඒ තක්සේරු වර්ෂය සඳහා සමාගම් බදු අයකළ හැකි ආදායම රුපියල් දෙලක්ෂ පනස් දහස ඉක්මවන් නාවූ මුදල

වෙඑකතුය බද්ද විය යුතුය. ";

(4) ඒ උපලේඛනයේ (VII) වන කොටස වෙනුවට පහත දැක් වෙන කොටස ආදේශ කිරීමෙන්—

"VII වන කොටස

(34 වන වගන්තිය)

ශ්‍රී ලංකාවෙහි නිර්වාසික සමාගමක්

1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම ආදායම් බදු අනුප්‍රමාණය—

සමාගමේ බදු අයකළ හැකි ආදායම් මත ............ සියයට 50

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම තක් සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය—

සමාගමේ බදු අයකළ හැකි ආදායම් මත ............ සියයට 45 ; ";

(5) ඒ උපලේඛනයේ (IX) වන කොටස වෙනුවට පහත දැක් වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"IX වන කොටස

(ශ්‍රී ලංකා මහ බැංකුව හැර) රාජ්‍ය සංස්ථා

1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය

රාජ්‍ය සංස්ථාවේ බදු අයකළ හැකි ආදායම් මත ...... සියයට 50

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය—

රාජ්‍ය සංස්ථාවේ බදු අයකළ හැකි ආදායම මත ...... සියයට 45 ;

(6) ඒ උපලේඛනයේ X වන කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"X වන කොටස

ඒකක භාර හෝ අන්‍යෝන්‍ය අරමුදල

පිළිවෙලින් 1990 අප්‍රේල් මස 1 වන දින සහ 191 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු අනුප්‍රමාණය—

ඒකක භාරයේ හෝ අන්‍යෝන්‍ය අරමුදලේ බදු අයකළ හැකි ආදායම මත ................................................ සියයට 50

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය—

ඒකක භාරයේ හෝ අන්‍යෝන්‍ය අරමුදලේ බදු අය කළ හැකි ආදායම මත .................... සියයට 45.".

38. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) උපලේඛනයේ I වන ඡේදයේ "1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන සියලු ඉලක්කම් සහ වචන වෙනුවට පහත දැක්වෙන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් :—

"1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

බදු අයකළ හැකි ආදායමේ ඊළඟ පළමු රු. 25,000 මත .......................................... සියයට 30

බදු අයකළ හැකි ආදායමේ ඊළඟ 25,000 මත ............ .......................................... සියයට 40

බදු අයකළ හැකි ආදායමේ ශේෂය මත ........................ .......................................... සියයට 50

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

බදු අයකළ හැකි ආදායමේ පළමු රු. 25,000 මත......... .......................................... සියයට 30

බදු අයකළ හැකි ආදායමේ ඊළඟ රු. 25,000 මත ......... .......................................... සියයට 40

බදු අයකළ හැකි ආදායමේ ශේෂය මත.........සියයට 45 ";

(2) ඒ උපලේඛනයේ 3 වන ඡේදයේ—

(අ) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයේ "1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එළඹෙන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ඡේදයේ (ii) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන්—

" (iii) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ...................... සියයට 35 ; " ;

(3) ඒ උපලේඛනයේ 4 වන ඡේදයේ " 1986 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියලුම භාරකරුවන් සම්බන්ධයෙන් ...... සියයට 50 " යන යෙදුම වෙනුවට " 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියලුම භාරකරුවන් සම්බන්ධයෙන් ........................................................................ සියයට 50.

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියලුම භාරකරුවන් සම්බන්ධයෙන් ......................... සියයට 35. " ;

(4) ඒ උපලේඛනයේ 5 වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්—

" හවුල් ව්‍යාපාර

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

හවුල් ව්‍යාපාරයේ බදු අයකළ හැකි ආදායම සම්බන්ධයෙන් ......... සියයට 50

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

හවුල් ව්‍යාපාරයේ බදු අයකළ හැකි ආදායම සම්බන්ධයෙන් ......................... සියයට 35. " ;

(5) ඒ උපලේඛනයේ II වන ඡේදයේ—

(i) ඒ ඡේදයේ (ආ) අනුඡේදයේ " 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා " යන යෙදුම වෙනුවට " 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා " යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(ii) ඒ ඡේදයේ (ආ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන්—

" (ඇ) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා—

(i) බදු අය කළ හැකි ආදායම් සම්බන්ධයෙන් ...................... සියයට 45,

(ii) (i) වන ඡේදය යටතේ ගෙවිය යුතු බද්ද එයින් අඩු කිරීමෙන් පසුව ලාභවල ශේෂය සම්බන්ධයෙන් ......................... සියයට 25. " ;

(6) ඒ උපලේඛනයේ 13 වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" 13. සේවා නියුක්තයින් සඳහා පමණක් දායක මුදල් ගෙවනු ලබන යම් සකසුරුවම්, ඉතිරි කිරීමේ හෝ ගොඩ නැගිලි සමිතියක් හෝ සුභසාධක අරමුදලක් හෝ 23(1) (ඞ) ඡේදයේ කාර්ය සඳහා අනුමත කරන ලද යම් පාරිතෝෂික අරමුදලක්—

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

සමිතියේ හෝ අරමුදලේ බදු අයකළ හැකි ආදායම සම්බන්ධයෙන් ........... සියයට 10 ; " ;

(7) ඒ උපලේඛනයේ 13 වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

" 14. (ඉහත සහ පළමුවන සහ දෙවන උපලේඛනවල සඳහන් නැතත් තෝ)—

බදු අයකළ හැකි ආදායම සම්බන්ධයෙන් .............. සියයට 20. ".

39. ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ හත් වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.**

" හත්වන උපලේඛනය (33අ (1) වගන්තිය)

1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(i) කුඩා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල් සම්බන්ධයෙන් ......... ............................................... සියයට 25

(ii) නිල ලැයිස්තු ගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදාහැරීමක මුදලට සමාන මුදල සම්බන්ධයෙන් .........සියයට 33 1/3

(iii) ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් හෝ කුඩා සමාගමක් හෝ නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් නොවන සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල සම්බන්ධයෙන් ......................... සියයට 50.

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(i) කුඩා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන මුදලට සමාන මුදල සම්බන්ධයෙන් ...... සියයට 25

(ii) නිල ලැයිස්තු ගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල සම්බන්ධයෙන් ...... සියයට 33 1/3

(iii) ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් හෝ කුඩා සමාගමක් හෝ නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් නොවන සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදාහැරීමක මුදලට සමාන මුදල සම්බන්ධයෙන් .............................. සියයට 40.".

අතීතගාමී ක්‍රියාත්මක වීම.

40. (1)මේ පනතේ 5 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියට කරන ලද සංශෝධන 1992 අගෝස්තු මස 26 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ 6 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට කරන ලද සංශෝධනය 1992 අගෝස්තු මස 26 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය .

(3) මේ පනතේ 9(2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඇ වගන්තියට කරනු ලබන සංශෝධනය 1990 නොවැම්බර් 29 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. තවද ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඇ වගන්තියේ (2) වන උප වගන්තියේ (ඇ) ඡේදයේ (iv) වන අනුඡේදයේ සඳහන් යම් ව්‍යවසායක් පමණක් කරගෙන යාමෙහි නිරත යම් සමාගමක් මේ පනත අරම්භවීමේ දින සිට එක් මාසයක් ඇතුළත ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවහොත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ ලෙස සියලු කාර්ය සඳහා සළකනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ 11 වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇඇ වගන්තියට කරන ලද සංශෝධනය 1991 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(5) මේ පනතේ 12 (2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රප්තියේ 23 (1) වන වගන්තියට කරන ලද සංශෝධනය 1992 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(6) මේ පනතේ 13(2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 (5ඇ) වගන්තියට කරන ලද සංශෝධනය 1990 නොවැම්බර් මස 29 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(7) මේ පනතේ 16(3) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියට කරන ලද සංශෝධනය 1992 අගෝස්තු මස 26 වන දින සිට බලාත්මකවූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(8) මේ පනතේ 9 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 38 (4) වන වගන්තියට කරන ලද සංශෝධනය 1988 සැප්තැම්බර් මස 8 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(9) මේ පනතේ 24 (2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තියට කරන ලද සංශෝධනය 1992 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(10) මේ පනතේ 27 (2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තියට කරන ලද සංශෝධනය 1992 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.".

**41.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. **(විදේශීය) රු. 1,160 යි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ** අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා, පසුව එළඹෙන **එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.**